අත්‍යාවශ්‍ය  කෙටි සාකච්චා සඳහා පමණක් අපි සූම් සාකච්චා පැවත්වීමට අපේක්ෂා කරමු. දීර්ඝව එකිනෙකා සමග සාකච්චා කිරිම අවශ්‍ය වන විට භෞතිකව රැස්වීම අවශ්‍ය බව අපේ විශ්වාසයයි.

සාර්ථක සහ ඵලදායි සූම් සාකචචාවක් සඳහා පහත කරුණු පිළිපදින්න.

1. සූම් සාකච්චාව සඳහා අන්තර් ජාල පහසුකම් හොඳ ස්ථානයක් වෙන් කරගන්න.
2. සාකච්චාව පැවත්වීම සඳහා වෙලාව කලින් දන්වා ඇති නිසා , එම කාලය තුල සුදුසු ස්ථානයක රැඳෙන්න. රිය පදවමින් සහභාගි වීම අනතුරු දායක වේ.වෙනත් උත්සව අවස්ථාවලදි  හා ජනතාව බහුල ස්ථානවලට සම්බන්ධ විමෙන් සාකච්චාවට බාධාවිය හැකිය.
3. ඔබ සූම් සාකච්චාවකට සහභාගි වීමට නියමිත බව ඔබේ ආදරණීයන් දැනුවත් කර තැබීමෙන්ඔවුන්ගෙන් ඔබට විය හැකි බාධා අවම කර ගන්න.
4. සූම් සාකච්චාව ආරම්භ කිරිමට පෙර විනාඩි පහකට පෙර අදාල සබැඳියෙන් පිවිසෙන්න.
5. සූම් සාකච්චාවට සුදුසු ඇඳුමකින් සිටින්න.
6. සෑම අවස්ථාවකදීම කැමරාව විවෘ තව තැබීම අත්‍යාවශ්‍ය වේ. ඔබගේ පසුබිමින් දිස්විය හැකි දේ ගැන අවධානය යොමු කරන්න.
7. ඔබේ තිරය තුල ඔබේ නම නිවරැදිව පෙනෙන පරිදි සටහන් කර ගන්න. ( සමහර විට ඔබේ සූම් තිරය තුල ඔබේ දරුවාගේ නම හෝ ඔබ සම්බන්ධවන ජංගම දුරකථනයේ නම සටහන් විය හැකිය)
8. ඔබ අසුන් ගත් පසු ඔබගේ ආසනයත් කැමරාවත් අතර අත දික් කල විට පවතින දුරට කැමරාව සකස් කර ගන්න.
9. සාකච්චාවට පැමිණීමේදි වැදගත් කරුණු සටහන් කර ගැනීම සඳහා ඔබේ සටහන් පොත් සුදානම් කර තබා ගන්න.
10. සැමවිටම ඔබේ ශිණුම නිහඬව තබන්න.
11. අදහස් දැක්වීමක් කිරිමට අවශ්‍ය නම් “අත ඔසවන සලකුණ” ඔසවා සංඥා කරන්න.
12. එක්වර කිහිපදෙනෙක් අදහස් දැක්වීමෙන් වැලකිය යුතුය.
13. ඔබේ අදහස් සංක්ෂිප්තව  කෙටියෙන් ඉදිරිපත් කල යුතු අතර වෙනත් අය විසින් ඉදිරිපත් කල කරුණු පුනරුච්චාරණය කිරිමෙන් වලකින්න.